පර්යේෂණ ආයතනයේ 75 වසරක අභිමානය
75 வருட ஆய்வின் சாதனை
75 Years of Research Achievement

# තේ තතු

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශනයකි ISSN - 1391-6785

දෙවන කාණ්ඩය, දෙවන කලාපය 2002 ජූලි - දෙසැම්බර්


## ළපටි තේ වගාවේ පොහොර භාවිතයේ දී මේ ගැනත් සිතන්න

තේ පැලයක් ක්ෂේත්‍රයේ සිටවීමෙන් පසු තේ වගාකරුවන්ගේ ඊලග ප්‍රධාන අරමුණ වන්නේ කුඩා පැලය හැකි ඉක්මනින් තේ දළු නෙලිය හැකි මට්ටමේ පදුරක් බවට වර්ධනය කරගැනීමයි. මෙහිදී තේ පැලය වරින්වර අවස්ථා කීපයකදී පුහුණු කිරීමත් පැලයේ වර්ධනය සඳහා පෝෂක ලබාදීමත් යන කරුණු දෙක ඉතා වැදගත් වේ. මෙම කටයුතු අවස්ථානුකූල ව නිවැරදි ව සිදු කළ යුතුය. නමුත් බොහෝ කුඩා තේ වතු හිමියන් අතින් සිදුවන අත්වැරදීම් නිසා ලපටි තේ වගාවන් හානියට පත්වූ අවස්ථා අපි අත්දැක ඇත්තෙමු. විශේෂයෙන් ළපටි



හානි වූ ළපටි තේ පැලයක්

තේ වගාවට පොහොර යෙදීම ඉතාම සැලකිල්ලෙන් කළ යුතුය. සිටුවා පලමු වසර තුල පැලයට ග්‍රෑම් 15 –25 පමණ වන සේ වාර 4 –6 ක් පමණ ටී 200 පොහොර යෙදීම කරන අතර දෙවන වසරේදී මෙම ප්‍රමාණය ග්‍රෑම් 20 –30 දක්වා වැඩි කළ යුතුය . පැල සිටුවා මාස 2 ක් පමණ ගත වු පසු පළමුවන පොහොර යෙදීම, සාමාන්‍යයෙන් අනුගමනය කළයුතු ක්‍රමයයි. මෙහිදී පැලය වටේට පැලයේ මුල සිට අඟල් 6 ක් පමණ ඈතින් අඟලක් පමණ ගැඹුරට හාරන ලද වලයකට හෝ අර්ධ වලයකට ඉහත පොහොර ප්‍රමාණය දමා පස් වලින් වැසීම නිවැරදි ක්‍රමයයි. ප්‍රමාණවත් ලෙස පසේ තෙතමණය පැවතීම හෝ ප්‍රමාණවත් ලෙස වර්ෂාව පැවතීම ඉතා අත්‍යාවශ්‍ය සාධකයකි. නමුත් බොහොමයක් කුඩා තේ වතු හිමියන් අතින් සිදුවන වැරදි කිහිපයක් මෙහිදී පෙන්වා දිය යුතුය.

පැලය ඉක්මනින්ම වර්ධනය කිරීමේ අරමුණ ඇතිව පොහොර නිර්දේශිත ප්‍රමාණයට වඩා යෙදීම කරන අවස්ථා ද එසේම ලැබෙන පලමු වර්ෂාවත් සමගම පොහොර යොදන අවස්ථා ද අත්දැක ඇත්තෙමු. පළමු වර්ෂාවෙන් පසු ඉදිරියට ප්‍රමාණවත් වර්ෂාවක් නොලැබුණ හොත් පොහොර යෙදීම පැලයට හානිකර ලෙස බලපායි. තවද පැල පුහුණුවට ඉතාමත් ආසන්න අවස්ථාවක හෝ තේ පැල පුහුණුවත් සමගම හෝ පොහොර යොදන කුඩා තේ වතු හිමියන් අප දැක ඇත්තෙමු. මෙවැනි අවස්ථාවක ප්‍රමාණවත් වර්ෂාවක් නොපැවති නිසා හෝ බලාපොරොත්තු වු වර්ෂාව නොලැබීම නිසා හෝ පැලවලට හානි වු අවස්ථා බොහෝ ය.

විශේෂයෙන් මෙවැනි අවස්ථා වල පත්‍ර කහ පැහැ ගැන්වීම, පත්‍ර පිලිස්සුන ස්භාවයක් දැක්වීම, පත්‍ර හැලීයාම වැනි ලක්ෂණ හානි වු පැල වල දක්නට ලැබේ. මෙම තත්වයෙන් යථා තත්වයට පත් වීමට පැලයට හැකි පමණ ජලය සැපයීම අවශ්‍ය වේ. නමුත් ජල සැපයීම අපහසු අවස්ථා වල හෝ කෙටි කලකදී වර්ෂාව නොලැබෙන අවස්ථා වල මෙලෙස පැල මැරීයාම වැලැක්විය නොහැකිය. පැල පුහුණුවකට පසු පොහොර යොදන විට පැලයේ ප්‍රමාණවත් පත්‍ර සංඛ්‍යාවක් පැවතිය යුතුය.

එනම් රිකිළි ලියලා අලුතින් පත්‍ර වර්ධනය වීම ආරම්භ වී පැවතිය යුතුය. විශේෂයෙන් මෙම තත්වය ඌව හා පහතරට කලාපවල වර්ෂාව ප්‍රමාණවත්ව නොලැබෙන ප්‍රදේශවල වයස අවුරුදු 2 දක්වා වු ලපටි තේ වගාවල දක්නට ලැබේ. මේ නිසා ලපටි තේ වගාවේ පොහොර යෙදීමේදී නිවැරදි ප්‍රමාණය හා නිවැරදි අවස්ථාව හොඳින් අනුගමනය කරන්නේ නම් හා එසේම පැල පුහුණුව වැනි කටයුතු වලදී තේ පර්යේෂණායතනයේ නිර්දේශයන් පිළිපැදීම මගින් එවැනි හානි වලක්වාගත හැක. පොහොර භාවිතය හා වෙනත් කටයුතු වලට අදාල අත් පත්‍රිකා තේ පර්යේෂණායතනයේ ඕනෑම ව්‍යාප්ති මධ්‍යස්ථානයකට පැමිණ හෝ තැපෑලෙන් ලබාගත හැක.


ආර්.එම්.ඒ.සී. රාජකරුණා